# සිද්ධි SIDDHI 3

බොහෝ විට කතා බහේදී සමහරුනට "**කාරයා**" යන වචනය නොදැනුවත්ව ම මුවගට ගලා එන්නේ තැන නොතැන බලලාය. **අයිතිකාරයා, මැනේජර්කාරයා, ප්‍රින්සිපල් කාරයා, ලෝයර් කාරයා, ෆාදර් කාරයා** පමනක් නොව **වයිෆ් කාරයා** දක්වා ද බස හසුරුවති. **ලියුම්කාරයා, ත්‍රී වීල් කාරයා, මාළු කාරයා, බස් කාරයා, වළි කාරයා, පොකට් කාරයා** සිට තව තව අමුතු කාරයෝද වෙති. මෙවැනි වදන් සමහර අවසථාවල දී පුද්ගල ගෞරවනීයත්වයට හානි ගෙනදේ.

මා රාජකාරී කල ප්‍රචාරකායතනයේ කාර්යාල සහකරුවකු වූ "**ගනේෂ්**" යම් පණිවුඩයක් රැගෙන මා වෙත දිව ඒයි.
සේර්...සේර්...**පොලිස් කාරයෙක්** ඇවිල්ලා...පොලිස් කාරයෙක්.
හා...හරි... හරි ගනේෂ් ඒ ...ඩී අයි පී මහත්තයා වෙන්න ඇති. ඔය කාරයා...කාරයා කිය කියා දුවන්න එපා. එයා ලොකු තනතුරක් තියෙන කෙනෙක්...

"ගනේෂ්" හිස කසා සිනාසෙයි. උපතින් ද්‍රවිඩයකු වූ ඔහු කාටත් ගරු සරුව ඇතිව වැඩ කටයුතු කරන අයෙකි. එනමුත් එය ඔහුට පුරුද්දට කියවුණා නිසැකය. නැත්නම් අපට "සේර්" කියා අමතන්නටත්, තවත් අයෙකුට එසේ අමතන්නටත් "ගනේෂ්"ට වුවමනා නොවේ.

සමහර වේලාවට සිංහල භාෂාව හොඳහැටි හසුරුවන අපටත් "**කාරයා**" කියන දේ හැම විටකදීම පටලවා ගන්නේ නම් කවර කතාද?
පොලිසියේ එවන් නිලධාරියෙකු මා හමුවන්නට බොහෝවිට එන්නේ නිර්මාණාත්මක යමක් කර ගන්නට බැව් මා හොඳ හැටි දනිමි. පොලිසියේ කැලැන්ඩරයේ යම් යම් වෙනස් කිරීම් කරගෙන යන කාලයක් නිසා ඒ මහතාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියෙමි.

"ගනේෂ්" ගේ පණිවුඩය ලත් සැනින් මා කාර්යාලය ඉදිරිපස ඇති අමුත්තනට වෙන්වූ ශාලාව දෙසට එබිකම් කළෙමි. මේ ඉන්නේ ඩී අයි පී මහත්තයා නම් නොවේ. පොලිස් කොස්තාපල් වරයෙකි. හිස් වැසුම නිසා එකවරම හඳුනාගන්නට අපහසුය. මා ඔහුට ලංවීමි.

"ආ...මහත්තයාට මතකද මාව...පෙරේදා ලිප්ටන් වටරවුම ලග...කොස්තාපල් වරයා එසේ කියනා විට කාරණය වැටහුණේය. **පෙර්දා මා ලිප්ටන් වටරවුමේදී මාර්ග නීති කඩකර යතුරු පැදිය ධාවනය කල නිසා දඩ නොගසා, නඩු නොගොස් බේරෙන්නට උදව්කලේ මේ කොස්තාපල්වරයාය.** මා ද පොලිසියේ ඇඳුරුම්කම් කිසිවක් නොකියා යම් මුදලක් ඔහු අතමිට මෙලෙව්වද , එය නොගෙන අවවාද කොට යන්නට හැරියේය. එවෙලේ මා බිස්නස් කාඩ්පත ඔහු අත තැබුවේ ඕනෑ වෙලාවක මට කතා කරන්නට කියාය.

ඉතිං...රාළහාමි ඇයි මේ හදිසියේම...මොකක්ද උවමනාව? ඔය මහත්තෑලා ඇක්සයිස් පොත් එහෙම අච්චු ගහනවද?... මොහු අප කරනා රැකියාව තේරුම් ගෙන නොමැති බව මට එවෙලේ හැගුනි.
...ආ ..නෑ රාළහාමි...අපි කරන්නේ ප්‍රචාරකටයුතුනේ... පොත් පත් ගහන්නේ ප්‍රින්ටර්ස්ලානේ...මා එසේ කියනාවිට ඔහු අතරමංවී ඇති බවක් ඔහුගේ මුහුණින් පෙනිනි.

ආ... කමක් නෑ එහෙනම්...මං හිතුවේ...
ඒකට කමක් නෑ...රාළහාමි කියන්න ඕනෑ උදව්වක්...
මේකයි මහත්තයා...අපේ ගමේ ඉරිදා දහම් පාසලේ තෑගි බෙදාදෙන උත්සවේ මේ මාසේ...ඉතිං මං හිතුවා මහත්තෑලෑ ඔෆිස් එකට කියලා ළමයිට දෙන්න ඇක්සයිස් පොත් ටිකක් ඉල්ලා ගන්න...

මට මොහු ගැන එවෙලේ හිතට නැගුණේ පුදුම අනුකම්පාවකි. ඒ වගේම ගෞරවයකි. පෙරදා ඔහු අතමිට මෙල වූ **සුංගම** ද ප්‍රතික්ෂේප කොට,මට අවවාද දී යන්නට සැලැස්වූ මේ පොලිස් නිලධාරියා නම් පොලිසියටම අවශ්‍යම නීතිය,සමාජිය පරිසරය සුරකින මහත්මයෙකි. මේ හමුවූ මොහොතේ ද ඉල්ලා උන්නේ ඔහුට අවැසි මුදල් නොව ඇක්සයිස් පොත් පමණකි. ඔහුගේ විස්තර අසා දැනගත් මා කාර්යාලිය සේවකයකු අතේ ඔහු රාජකාරි කරනා පොලිස්ථානයට ඇක්සයිස් පොත් පාර්සලයක් යැව්වෙමි.

# මහ රෑ හමු වූ නිළියන් දෙදෙනා

සවස් යාමයේ වැඩ කටයුතු වල නිරතව සිටිය දී ආයෙමත් "ගනේෂ්" තවත් පණිවුඩයක් රැගෙන මා වෙත දිව ඒයි. එනමුදු උදෑසන මා කිව් දේ මතක් වී දෝ හඩ බාලවෙයි." සේර්...පොටෝ කරන එක්කෙනෙක් ඇවිල්ලා."යි ඔහු කියන්නට ආ දෙය මෙවර කල්පනාවෙන් කියන්නට තැත දරයි.
මා යන විට අසේල කැමරා ආම්පන්නද රැගෙන කාර්යාලය ඉදිරිපස මා බලාපොරොත්තුවෙන් සිටී. කොහොමද බිසීද?...මම මේ ෆොටෝග්‍රැෆි එසයිමන්ට් එකකට ගිහින් එන ගමන්...ඔළුව දාලා යන්න හිතුණා...අදත් රෑ වැඩ වගේ...අසේල අසනා මේ ප්‍රශ්නය අපට සාමාන්‍ය දෙයකි.

වෙළඳ ප්‍රචාරකායතනවල රාජකාරී කටයුතු වලට රැයක් දවාලක් නොමැත. මේ ක්ෂේත්‍රයේ බොහෝ දෙනා ඔවුනොවුනගේ සේවාව ලබාදෙන ආයතනවලට උපරිමය ලබාදෙන්නේ තරග කාරීත්වයක් ඇති ප්‍රචාරක මාධ්‍ය කලාව නිසාවෙනි.

අසේලගේ සමුගැනීමෙන් අනතුරුව නැවතත් සුපුරුදු කාර්යයන්ට අවතීර්ණ වීමි. රාත්‍රී හත අට වනවිට බොහෝ වැඩ කටයුතු අවසන්ය. විවේකයක් ගතයුතු යැයි මාගේ සිත කියයි.

නිතොර එකතුවෙන, දකින සුපිරි අවන්හල් වලින් මදක් මිදුණු මා ද, කාර්යාලයේ සගයන්ද ආයතනයට යාබද ව පැවති නිදහස් ස්ථානයකට පිය නගන්නේ කලාව, දේශපාලනය, එකල පැවති භීෂණය ගැන විවෘත සංවාදයක යෙදෙන්නටය. බොහෝ වේලාවට ඝෝෂාකාරී වටපිටාවකින් තොරවූ නිදහස් චතුරශ්‍රය යාබද, ගුවන් විදුලි සංස්ථාව කෙළවර පිහිටි මාරගස් සෙවන දුන් හරිත බිම් පියස මේ කතිකාවට යෝග්‍ය ඉසව්වකි. වාහනයක්, දෙකක් නතර කොට මායිම් කොට හදා ගන්නා අපේ කතිකාවේ අඩවිය වෙනත් කොහේටත් වඩා සැපදායී පරිසරයකි.

එකල අපට නිදහස් තැනක් මුත් නිදහස් චතුරශ්‍රය අසල එවන් දෙයකට සුදුසු තැනක් නොවේ. එදවස අප ද කර ඇත්තේ මහත් වරදකි..

කෙසේ හෝ වේවා රාත්‍රී නමය වන්නට කලියෙන් කොල්ලුපිටියේ ප්‍රේමසිරි ස්ටෝර්ස් වෙතින් ගෙන්නා ගන්නා "**රහ මෙර**" කතා බහට අතුරු පසකි. විඩාවට වින්දනයකි. එකිනෙකා ගේ විනෝදාත්මක කතාබහ අතරේ වේලාව නොදැනුවත්වම ගෙවේ. මෙසේ කාලය ගෙවෙද්දී අප දකින්නේ වෙනදා නොදකින දර්ශණයකි. ඒ අසල පාරේ ලතාවකට ගමන් ගන්නා කොණ්ඩා වවාගත් තරුණයන් දෙදෙනෙකි.

**පුදුමයි උන් මන්ත්‍රී කෙනෙක් ගෙ හරි ඇමති කෙනෙක් ගෙ හරි නමක් නොකිව්ව එක. ඔන්න ඕක අල්ලලා දානවා.**

මේ රෑ...මේ පාළු පාරෙ මුන් කොහේ යනවද?...අපේ සගයෙකුගෙන් ජගත් අසයි.
ගමන් ගන්නා දෙදෙනා පිරිමි ස්වරූපය තිබුණත් ලතාවකට ගමන් ගන්නා ආකාරයෙන් පැහැදිලිවම ඔවුන් කුමන තරාතිරමක අයද යන්න වැටහේ.
ඒයි...මල්ලිලා මේ රෑ කොහේද යන්නේ.....ජගත් අත්පුඩි ගසා කතා කරයි.
හානේ... මල්ලිලා කිව්වේ අපිටද අනේ...අපි මල්ලිලා නෙමෙයි මෙයා..ඒ මේ අත පැද්දෙමින් දෙදෙනාම අප අසලට පැමිණේ.
**"හා.. මල්ලිලා නෙමෙයි නං නංගිලා...කොහෙද මේ රෑ වෙලා..."**
"අපි මේ ආසයි බයයි ඉවර වෙලා එන ගමන්...හරි මහන්සී නේද අනේ.." අනෙකාගේ උරහිසට ගසමින් හුරතල් වේ.
ආසයි බයයි...ඒ මොකක්ද...
ඒ...මෙයා ඒක දන්නෙත් නෑ...ආසයි බයයි ෆිල්ම් එකේ ඩාන්ස් කෑල්ලකට අපිත් හිටියා...හරි ෂෝක් ඇක්ටර්ස්ලා හරි හොඳයි මෙයා...

හා...එහෙනං හොඳට තියෙන්න ඇති...ජගත් එසේ කියනා විට සියල්ලෝම මහා හඬින් සිනාසුනහ.
චි...මෙයාලා හරි නරකයි...මළකෝලං...එන්න මෙයා යන්න..අනෙකාගේ අතින් ඇදන් යන්නට සැරසේ.
හප්පෝ...යන කේන්ති...ජගත් ඔවුනට අතකින් සෙමින් තට්ටු කර තව තවත් ප්‍රමෝදයට පත් කරයි.
ආ..ඒකෙන් කමක් නෑ..ඩාන්ස් දාලා මහන්සිනේ...මෙයින් ඕනෑ නම්..ජගත් ප්ලාස්ටික් කෝප්පයකට "රහ මෙර" ස්වල්පයක් හැලුවේය.




**චී...අපට පුරුදු නෑ මෙයා...ඕවා බීලා බස්වල යන්න පුළුවන්ද?..ඟඳායි..**
එහෙනං ...ඉතිං දුමක් අදිමු...
**ඊර්ර්...ඔයාල හරි නරකම නරකයි...සිගරට් බීවාම ලිප්ස් කලු වෙනවානෙ මෙයා...**
හරි..හරි ඔච්චයින් වැඩක් නෑ..දැන් දෙන්නගෙ නම් කිව්වෙ නෑනෙ...අපේ සගයකු විස්තර අසමින් අසයි.
මෙවෙලේ දෙදෙනා ඔවුන් දෙදෙනාව හඳුන්වා දෙන්නට ගොස් සිදුවූයේ මහා ජංජාලයකි.
එකෙකු ජනප්‍රිය නිළියකගේ නම කියුවේය. එය අසා සිටිවුනට සිනහව නවත්වා ගන්නට නොහැකි විය. අනෙකා තවත් ජනප්‍රිය නිළියකගේ නමක් කියුවේය.

එකවරම ඉදිරියට පැන්න ජගත් මොකක්ද කිව්වේ..පො..........කියූ විගසම ගැහැණු තරුණයෝ පස්ස නොබලාම දුවන්නට පටන්ගති.

ජගත් ගේ කෙටි දුර ධාවනය ඇරඹිණි. අපට සිනහව මෙන්ම වෙන්නට යන්නේ කුමක්දැයි තේරුම් ගැනීමට තරම් වෙලාවක් නොවීය. දෙදෙනා පසු පස එළවාගෙන යන ජගත් නිදහස් චතුරශ්‍රයේ සිට ඇල්බට් වන්දුවංකයෙන් එපිටට ම එළවාගෙන යනු ලැබීය.

වහා යතුරු පැදිය පණ ගැන්වූ දර්ශ ජගත් හඹා ගොස් ඔහුව නංවාගෙන ආවේ බොහෝ වෙහෙසක් දරාය. හතිලන ජගත් ගේ කෝපය නිමක් නැත.

"ඇයි මචං අර එකෙක් කිව්වෙ මගේ නංගි ගේ නමනේ. ඡිග්..මුන් ඒ නමුත් දාගෙන කරන වැඩ බලාපල්ලා...

කාරණය අපට පැහැදිලිය. ජගත් ගේ නංගී සම්මානලාභී ජනප්‍රිය නිළියකි. එහෙයින් ඔහුට ක්ෂණික කෝපයක් හටගෙන ඇත. මෙවෙලේ සගයන්ගෙන් වැඩි මහල්ලා වූ රත්නසූරිය ජගත් ගේ කෝපය බාල කරන අටියෙන් අවවාදයක් දෙනු ලැබිණ.

"ජගත් ඔය මිනිස්සු අහිංසකයෝ...පොඩ්ඩක් හිතන්න ඔයගොල්ලන්ම නේද විහිළුවට ඈඳා ගත්තේ.

අනික එයාලා එච්චර ආසා කරන නිළියක් නිසානේ ඔය නම දාගෙන තියෙන්නේ. පුදුමයි උන් මන්ත්‍රී කෙනෙක් ගෙ හරි ඇමති කෙනෙක් ගෙ නමක් හරි නොකිව්ව එක. ඔන්න ඕක අල්ලලා දානවා. ඒ මිනිස්සුත් මේ සමාජේ ජීවත් වෙන්න ඕනා. **අයිසේ ...ඒ මිනිස්සු වෙනස් ලිංගිකත්වයක් තියෙනවා කියලා පහල දාන්න හොඳ නෑ"....**

රත්නසූරිය ගේ කියමනේ යථාර්ථය වටහා ගන්නට පිරිසට වැඩි වේලාවක් නොගියේය. නමුත් මේ සිද්ධියෙන් පසුව මේ ගැන කතා බහ නොකරන්නට අපේ හිතවතුන් වග බලා ගත්තේ ජගත් ට දැනෙනා වූ ලජ්ජාවත්, නැගෙනා වූ කෝපයත් තුරන් කිරීමේ අටියෙනි.

